

# විශ්මිත වු යේසුස්වහන්සේගේ ජීවිතය

නොමිලයේ - විකිණීමට නොවෙ

අවුරුදු ගණනාවකට කළින් ජීවත් ව මිය ගිය විශේෂ පුද්ගලයෙකු ලෙස ජේසුස්වහන්සේව සැලකීමටනොහැකිය. දේව වචනයට අනුව උන්වහන්සේ මැවුම්කාර දෙවියන්වහන්සේය.උන්වහන්සේ මේ පොළොවෙහි මනුෂ්‍යාකාරයෙන් ජීවත් වී තමන්ගේ ජීවමාන ලේ පරිත්‍යාග කලේ ඒ තුළ මනුෂ්‍ය සංහතිය පාපයේ බලයෙන්,යක්ෂයාගෙන් සහ මරණයෙන් මුදවා ගැනීමටයි.උන්වහන්සේ තමන්වහන්සේ වෙතට පැමිණෙන අයට සදාකාල ජීවනය දෙන පිණිස අදටත් ජීවමානයි.ජේසුස්වහන්සේ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ජීවනය හා මරණය අතර කාරණාවක්.පුත්‍රයාණන්වහන්සේ පිළිගත් තැනැත්තාට මේ ජීවනය ඇත්.දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් නොපිළිගත් තැනැත්තාට ඒ ජීවනය නැත.(1 ජොහන් 5:12) අන් කිසිවෙකු මගින් ගැළවීමක් නැත;මන්ද,අපේ ගැළවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුළු ලොවෙහි ම මිනිසුන් අතර නැත.( ක්‍රියා 4:12) ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මේ විශ්මිත වු ජීවිත කථාන්තරය ඉගෙන ගැනීම තුළින් දෙවියන්වහන්සේ ඔබට සැබැවින්ම අත්දකින්නට හැකිවේවා යි පතමු.සදාතන ජීවනය මේය: එක ම සැබෑ දෙවියන් වන ඔබ ද,ඔබ විසින් එවන ලද තැනැන්වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද, දැනගැනීමය. ජොහන් 17:3 ජේසුස්වහන්සේව ඔබගේ හදවත තුළට ගැළවුම්කාරයාණන් සහ ඔබගේ ස්වාමින්වහන්සේ ලෙස පිළි අරගෙන තිබෙනවාද? එසේ නැත් නම් අදම ඒ දේ කරන්න.

# ජේසුස්වහන්සේ ඉපදීමට පෙර සිටම පැවතුන සේක 

ආරම්භයේ දී, ධර්මයාණෝ සිටි සේක; ධර්මයාණෝ දෙවියන්වහන්සේ සමග සිටි සේක; ධර්මයාණෝ දෙවියන්වහන්සේව ම සිටි සේක.ආරම්භයේ දී උන්වහන්සේ, දෙවියන්

වහන්සේ සමග සිටි සේක. සියල්ල උන්වහන්සේ කරණකොට ගන මවනලදී;උන්වහන්සේ නොමැතිව මවන ලදකිසිවක් නො වී ය.ධර්මයාණෝ මංසගතව අප සමග වැඩ විසු සේක.

ජොහන් 1 :1-3, 14ඒ

දෙවියන්වහන්සේ ආදී යුගවල දී,නොයෙක් විට ද විවිධාකාරයෙන් ද, දිවැසිවරයන් මගින් අපේ පිය වරුන්ට කතා කළ සේක.එහෙත් දැන් මේ අවසාන කාලයේ දී උන්වහන්සේ සිය පුත්‍රයාණන් මගින් අපට කතා කළ සේක.උන්වහන්සේ කරණකොට ගෙන දෙවියන්වහන්සේ මුළු විශ්වය මවා,සියල්ලේ උරුමකාරයාණන් කොට උන්වහන්සේ පත් කළ සේක.

හෙබ්‍රෙව් 1: 1-2

එහෙත් පුත්‍රයාණන් ගැන:දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය සදහට ම පවත්නේ ය; ස්වාමිනි,ආරම්භයේ දී ඔබ පොළොවේ අත්තිවාරම් ලු සේක,ස්වර්ග ලෝක ඔබගේ මැවිලි ය.

හෙබ්‍රෙව් 1:8 ඒ,10

"සමිදාණන්වහන්සේ ම නුඹලාට ලකුණක් දෙන සේක.බලන්න,කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහිකරන්නී ය.එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය." යෙසායා 7:14

"එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා!තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නෙහි ය.එහෙත්,ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේ ය.එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන් ද පැරණි යුගයෙන් ද එන්නක්". මීකා 5:2

අපට ළදරුවෙක් උපන්නේ ය; අපට පුත්‍රයෙක් දෙන ලද්දේය;එතුමාණෝ අපේරජු වන සේක.එතුමාණෝ අසිරිමත් උපදේශකයාණෝ ය; ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය;සදාතන පියාණෝ ය; සාමයේ කුමාරයාණෝ ය යි කියනු ලබන සේක. වැඩි වර්ධනය එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන්නේ ය; යෙසායා 9:6-7බී

මිනිසුන් විසින් පිළිකුල් කොට එපා කරනු ලැබූ හ. දුක හා වද වේදනා දැරූ මිනිස් කෙනෙක් වූ හ.එතුමාණන් ඉසුලුවේ අපේ දුක ය. දරාගත්තේ අපේ පීඩා ය. මේවා දඬුවම් යයි අපට සිතුණේ ය. දෙවි තුමන් දුන් පහර යයි අපට හැඟුණේ ය. එතුමණන් තුවාල ලැබුවේ අපේ අපරාධ නිසා ය.

පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය.

යෙසායා 53: 3 ඒ ,4-5ඒ

දෙවියන්වහන්සේ අපට පොරොන්දු වී ඇත.අපළය බලාපොරොත්තුවෙන් සිටිමු.

2පේදුරු 3:10-13

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පැවති ජවිතා කල්පයමඔබ තුළත් පවතීවා!මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන්වහන්සේ,මරණය,එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වු සේක.

පිලිප්පි 2:5බී -8

මාගේ ම කැමැත්තෙන් මා පැමිණියා නොව, උන්වහන්සේ මා එවා වදාළ සේක.

පළමු මිනිසා භූමියෙන් ය; ඔහු භෞමික ය;දෙවෙනි මිනිසා ස්වර්ගයෙන් ය;(ඔහු ස්වර්ගික ය)

එහෙයින්, ක්‍රිස්තුස්වහන්සේ ලෝකයට වඩින කල දෙවියන්වහන්සේට මෙසේ වදාළ සේක. “ඔබට පුද පඬුරු රීසි නැත.එහෙත් ඔබ මට සිරුරක් සූදානම් කළ සේක;

හෙබ්‍රෙව් 10:5බී

එහෙයින් පවුලේ සියලු දරුවන්ට එක ම මාංසයත් රුධිරයත් පොදුවේ ඇතිවා සේ ම උන්වහන්සේත් එම මිනිස් ස්වභාවයට පංගුකාර වු සේක.එසේ කෙළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයා මරණය මඟින් විනාශ කොට, දිවි ඇති තාක් මරණ භයින් වහල්කමට යටත් ව සිටින සියල්ලන් නිදහස් කරන පිණිස ය.

හෙබ්‍රෙව් 2:14-15

කුමක් හෙයින් ද මනුෂ්‍ය පුත්‍රයාණන් වුව ද වැඩියේ සේවය ලැබීමට නොව සේවය කිරීමට ය; බොහෝ දෙනා උදෙසා මිදීමේ මිලයක් වී සිය දිවි පිදී මට ය. මාර්ක් 10:45

මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගළවාගන්නට ද වැඩම කළ සේක. යි වදාළ සේක. ලූක් 19:10

දෙවියන්වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ, ලෝකයා විනිශ්චය කරන පිණිස නොව, උන්වහන්සේ කරණකොටගෙන ලෝකයා ගළවනු ලබන පිණිස ය.

ජොහන් 3:17

ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින් "මම රජෙක් යයි ඔබ ම කියන්නෙහි ය. මා උපන්නේත්, ලොව පහළ වුයේත්, සත්‍යයට සාක්ෂි දරන පිණිස ය; සත්‍යයෙහි පිහිටි සියල්ලෝ මාගේ හඬ අසති" යි වදාළ සේක.

ජොහන් 18:37බී

පව්කාරයන් ගළවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට වැඩිය සේක.

1 තිමෝති 1:15ඒ

ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් අප උන්වහන්සේ කරණකොටගෙන ජීවත් වන පිණිස ලෝකයට එවා වදාළ කාරණයෙන් ය.

1 ජොහන් 4:9බී

# ජේසුස්වහන්සේ ආශ්චර්යමත් ලෙස උපත ලැබූ සේක 

ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන්වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවකු වෙත යවන ලදී.ඒ කන්‍යාවගේ නම මරියාය.මරියාණෙනි බිය නොවන්න.ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාදය ලද්දෙහි ය.ඔබ පිළී සිදගෙන පුතෙකු ලබන්නෙහි ය.උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක ;උන්වහන්සේගේ පියා වු දාවිත්ගේ සිංහාසනය 'දෙවි ස්වාමින්වහන්සෙ උන්වහන්සේට ප්‍රධාන කරන සේක;උන්වහන්සේගේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහටම රජකම් කරන සේක; උන්වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ යයි කීය.එවිට මරිය තුමී දේවදූතයාට කථා කොට,මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකි දැයි ඇසුවාය. දේවදූතයා ඇට උත්තර දෙමින් ශුද්ධාත්මයාණන් 'වහන්සේ ඔබ කෙරෙහි පහලවන සේක.පරමෝත්තම ණන්ගේ ආනුභාවයද ඔබ වසාගන්නේය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන්වහන්සේගේ පුත්‍රයා ණෝ යයි කියනු ලබන සේක. බලන්න ඔබේ ඥාති වරයකි වන එළිසබෙත් ඇගේ මහලු වයසේදී පුත්‍රයෙකු පිළිසිද ගත්තාය. වඳ යයි කී ඇයට දැන් සවෙනි මාසය ය.මක්නිසාද දෙවියන්වහන්සේ

ට නොකළ හැකි කිසිවක් නැතැ යි කීවේ.ය

ලූක් 1:26බී -27,30-37

තව ද එසමයෙහි, අධිරාජ්‍යයේ සියලු වැසිය න්ගේ සංගණනයක් ගැනීමට අගෝස්තුස් අධි රාජ්‍යයා වෙතින් නියෝගයක් නික්මිණි.මේ වනාහි කුරේනියස් සිරියාවේ ආණ්ඩාකාරයාව සිටිය දී කරන ලද පළමු වන සංගණනය යි.සියල්ලෝ ලියාපදිංචි වන පිණිස තම තමන්ගේ නුවර වලට ගියහ. යෝසෙප් ද දාවිත්ගේ වංශය හා පෙළපතට අයිති වුයෙන්,ගලීලයේ නාසරෙත් නුවරින් නික්ම ජුදයේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවර බලා ගියේ ය.ඔහු ගියේ, තමාට විවාහ ගිවිසුම් දුන්, ගැබ්ගෙන සිටි මරිය තුම් සමග ලියාපදිංචි වන පිණිස ය.තවද,ඔවුන් එහි සිටිය දී ඇයගේ ප්‍රසව කාලය සම්පුර්ණ විය. ඈ කුළුදුල් පුත්‍රයා බිහිකොට රෙදි වලින් ඔතා,නවාතැන් ගෙයි ඉඩකඩ නොතිබුණු බැවින් ,ගවඔරුවක බෑව්වා ය.

තවද ...එවිට සමිදාණන්වහන්සේගේ දුතයෙක් ඔවුන්ට දර්ශණය විය:සමිදාණන්වහන්සේගේ තේජශ්‍රිය ඔවුන් සිසාරා බැබලිනි:ඔහුන් අතිශයින් බියපත් වු හ. එහෙත් දේවදූතයා ඔවුන්ට කථාකොට “බියනොවන්න; මෙන්න, සකල ජනයා හට ඉතා ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි. මක්නිසා ද,ස්වාමින් වන ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය.රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිදෙක් ඔබට සම්බ වන්නේ ය.එය ඔබට සලකුණ ය”යි කී ය.ඒ ඇසිල්ලෙහි ම දේව දුතයා සමග ස්වර්ග සේනා සමුහයක් දෙවියන්වහන්සේ පසසමින්,“අති උසස් තැන්හි දෙවිදුන්ට මහිමය ද මිහි පිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේ වා යි” ගී ගැයු හ. ලුක් 2:1-14

උන්වහන්සේගේ චර්මඡේදන පිළිවෙත සඳහා අටදවස පිරුණු කල, උන්වහන්සේ කුසෙහි පිළිසිඳගැනීමට පෙර දේව දූතයා විසින් දෙන ලද, ජේසුස් යන නාමය උන්වහන්සේට තබන ලද්දේ ය. ලූක් 2:21

එකල, සිමියොන් නම් මිනිසෙක් ජෙරුසලමෙහි විසී ය. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දැහැමි බැතිමතෙකි. ශුද්ධාත්මයාණෝ ඔහු කෙරෙහි වැඩහුන්හ. සමිඳාණන්වහන්සේ අභිෂේක කළ ක්‍රිස්තුන් වහන්සේ දක්නට පළමුවෙන් ඔහු මරණය නොදක්නේ ය යි ශුද්ධාත්මයාණන් විසින් ඔහුට අනාවරණය කරනු ලැබ තිබිණි. ඔහු ශුද්ධාත්මයානුභාවයෙන් දේව මාලිගාවට පැමිණියේ ය.ළදරු ජේසුස්වහන්සේ පිළිබඳ ව ව්‍යවස්ථාවෙහි සඳහන් වත්පිළිවෙත් ඉටු කරනු වස්…ඔහු උන්වහන්සේ දෝතින් වඩාගෙන මෙසේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කෙළේ ය : සමිඳුනි,ඔබ පොරොන්දු වූ ලෙස ම දැන් ඔබ දාසයා හට ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත, මන්ද, ගැළවීම මාගේ දෙනෙතින් දිටිමි.එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද විජාතීන්ට එළිය දෙන අලෝකය ද ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද වේ.උන්වහන්සේ පිළිබඳ ව කී දේ ගැන උන්වහන් ගේ පියා ද මවු ද මවිත වූ හ. සිමියොන් ඔවුන්ට ආශිර්වාද කරමින් උන්වහන්සේගේ මව වූ මරිය තුමීට කතා කොට, මේ දරුවා ඉශ්‍රායෙල්හි බොහෝ දෙනෙකුගේ වැටීම හා නැඟීම පිණිසත් ,ප්‍රතික්ෂේපයට ලක් වන දේව සලකුණක් වන පිණිසත් නියම ව සිටී. ලූක් 2:25-34

හෙරොද් රජු දවස ජුදයේ බෙත්ලෙහෙමෙහි ජේසුස්වහන්සේ උපන් කල, පෙර දිගින් ශාස්ත්‍රුව න්තයෝ ජෙරුසලමට අවුත්, ජුදෙව්වරුන්ට රජව උපන් උතුමාණෝ කොතැන්හි ද? අපි එතුමාණන් ගේ තාරකාව පෙරදිග දී දැක, එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවෙමු යි කී හ.

එපවත් ඇසූ හෙරොද් රජ ද මුළු ජෙරුසලම් ජනතාව ද කැළඹුණාහ. එකල ඔහු සෙනගගේ සියලු නායක පූජකයන්ද විනයධරයන්ද රැස්කරවා,

“ක්‍රිස්තුස්වහන්සේ කොතැන්හි උපදින සේක් දැයි”ඔවුන්ගෙන් විචාළේ ය.ඔව්හු කතා කොට, ජුදයේ බෙත්ලෙහෙමෙහි ය ; ඒ ගැන දිවැසිවරයා මෙසේ ලියා තිබේ.රජුගේ බස් අසා ඔව්හු පිටත් ව ගියහ.පෙරදිග දී ඔවුන් දුටු තාරකාව, ළදරුවා සිටි තැනට අවුත් ඉහළින් නවතින තුරු, ඔවුන්ට පෙරටුවෙන් ගියේ ය.තාරකාව දැක ඔව්හුඅතිශයින් ප්‍රීති ප්‍රමෝද වූහ.ඔව්හු ගෙට පිවිස,ළදරුවා සිය මව වූ මරිය තුමී හා සමග සිටිනු දැක,පසග පිහිටුවා වැඳ,සිය කරඬු ඇර රන් ද,තුවරලා ද,ගන්ධරස ද යන පඬුරු උන්වහන්සේ ට පිදූ හ.තවද,හෙරොද් වෙත ආපසු නොයන ලෙස සිහිනයකින් දන්වනු ලැබූ ඔව්හු අන් මගකින් සිය රට බලා ගියහ. මතෙව් 2:1-5 , 9-11

අහසේ තවත් පුදුම දර්ශනයක් විය. හිස් හතක් ද අං දසයක් ද තවත් හිස් මත කිරුළු සතක් ද ඇති මහ රතු මකරෙකි. ස්ත්‍රිය ඒ සියලු මනුෂ්‍ය ජාතීන් යගදාවකින් ආණ්ඩු කරන පිරිමි දරුවෙකු ප්‍රසූත කළාය.

එළිදරව් 12: 3 -5බී

ඔවුන් ගිය පසු සමිඳාණන්වහන්සේගේ දූතයෙක් සිහිනයකින් යෝසෙප්ට දර්ශනය වී, ඔහු අමතා, "නැඟිට ළදරුවාද උන්වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස්, මා දන්වන තුරු එහි නැවතෙන්න. මන්ද, හෙරොද් රජ ළදරුවා මරාදැමීමට සොයති යි කීය. ඔහු රාත්‍රියෙහි නැඟිට ළදරුවා ද උන්වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස්, හෙරොද්ගේ මරණය දක්වා එහි සිටියේය. එකල හෙරොද

තෙමේ ශාස්ත්‍රවන්තයන් විසින් තමා රවටනු ලැබූ බව දැක, අතිශයින් උදහස් විය. එවිට ඔහු ශාස්ත්‍රවන්තයන්ගෙන් විමසා, හරියාකාරව දැනගත් කාළය අනුව, දෑවුරුදු වයස් වූ ද ඊට බාල වූ ද, බෙත්ලෙහෙම හා ඒ අවට මුළු පෙදෙසෙහි සිටි සියලු පිරිමි දරුවන් මරාදැමීමට අණ කෙළේය.

මතෙව් 2: 13බී -15 බී, 16

# ජේසුස්වහන්සේගේ ළමා විය

දරුවා වැඩී ශක්තිමත් ව ප්‍රඥාවෙන් පූර්ණ විය;දෙවියන්වහන්සේගේ ප්‍රසාදය උන්වහන්සේ කෙරෙහි විය. යේසුස්වහන්සේගේ මව්පියෝ අවුරුදු පතා පාස්කු උළෙල සඳ හා ජෙරුසලමට ගියහ. උන්වහන්සේ දොළොස් හැවිරිදි වු කල ඔව්හු සිරිත් ලෙසළ් මංගල්‍යයට ගියහ.ඔවුන් නියමිත දවස් ගෙවාපෙරළා එන අතර,ජේසුස්කුමරාණෝ ජෙරුසලමේහි රැදුණු සේක; එහෙත්,උන්වහන්සේ ගේ දෙමව්පියෝ ඒ බව නොදැන, උන්වහන්සේ වන්දනාකාර පිරිස සමග ඇතැයි සිතාගෙන...එහෙත් සම්බ නොවුයෙන්, ඔව්හු උන්වහන්සේ සොයමින් ජෙරුසලමට පෙරළා ගියහ. තෙදිනකට පසු ඔව්හු උන්වහන්සේ දේවමාළිගාවේ පඩිවරයන් මැද වැඩහිද ඔවුන් කී දේ අසමින් ද ඔවුන්ගෙන් ප්‍රශ්ණ විචාරමින ද සිටිනු දුටුවෝය.ඒ ඇසු සියල්ලෝ ම උන්වහන්සේගේ බුද්ධි මහිමය හා පිළිතුරු ගැන විස්මිත වු හ. දෙමවුපියෝ උන්වහන්සේ දුටු කල මවිත වු හ. උන්වහන්සේගේ මෑණියෝ, "පුතා, කුමක් නිසා අපට මෙසේ කෙළේ ද? බලන්න, ඔබේ පියා ද මම ද දුකින් තැවි තැවී ඔබ සෙව්මු"යි කී ය. එවිට උන්වහන්සේ පිළිතුරු දෙමින්, "ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහුදැ"යි ඔවුන්ට වදාළ සේක. යේසුස්වහන්සේ ප්‍රඥ මහිමයෙන් හා කාය ශක්තියෙන් දෙවියන්වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ද වැඩුණු සේක.

ලූක් 2:40-49, 52

දෙවියන්වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් වී ය. ඔහුගේ නම ජොහන් ය.මම නම්, යෙසායා දිවැසිවරයා කී පරිදි,සමිදාණන්ගේ මග පිළියෙළ කරන්නැ"යි පාළු කරයෙහි මොරගසන්නෙකුගේ හඩ වෙමියි ජොහන් පිළිතුරු දුනි.පසු දින ජොහන් තෙමේ ජේසුස්වහන්සේ තමා සමීපයට වඩිනු දැක, "මෙන්න ලෝකයේ පාපය දුරලන දෙවියන් 'වහන්සේගේ බැටළු පෝතකයණෝ! තවද, ජොහන් සාක්ෂි දරමින්,"ආත්මයාණන් පරවියෙකු මෙන් අහසින් බැස උන්වහන්සේ මත වැඩ හිදිනු මම දිටිමි; මම උන්වහන්සේ නොහැඳින සිටියෙමි; එහෙත් වතුරෙන් බව්තීස්ම ස්නාපනය කරන්නට මා එවා වදාළ තැනැන්වහන්සේ ම මට කතා කොට,...ඒ වනාහි ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම ස්නාපනය කරනතැනැන්වහන්සේය" යි වදාළ සේක. ඒ දේ මම ම දිටිමි;දැක, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යයි සාක්ෂි දැරුවෙමි යි කීවේ ය.

ජොහන් 1 : 6, 23, 29, 32-34

ජේසුස්වහන්සේ බව්තීස්ම ස්නාපනය ලැබ, එකෙණෙහි ම දියෙන් ගොඩ ආ සේක. එවිට ස්වර්ගය විවර විය.දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිමින් තමන් පිට පැමිණෙනු උන්වහන්සේ දුටු සේක.තවද,මොහු මාගේ ප්‍රියාදර පුත්‍රයා ය.මොහු කෙරේ මම ඉතා ප්‍රසන්න වී සිටිමි යි ස්වර්ගයෙන් හඩක් නික්මිණි.

මතෙව් 3 :16-17

# ජේසුස්වහන්සේ පරීක්ෂාවෙන් ජය ගැනීම

එවිට පරීක්ෂාකාරයා උන්වහන්සේ වෙත අවුත්, "ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල් ගෙඩි, පාන් ගෙඩි වන්න අණ කළ මැනවැ" යි කී ය. උන්වහන්සේ උත්තර දෙමින්,මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව;දෙවියන්වහන්සේ ගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය"කියා ලියා ඇතැ"යි වදාළ සේක.එවිට යක්ෂයා උන්වහන්සේ ශුද්ධ නුවරට පමුණුවා දේවමාලිගාවේ කොත මුදුනේ සිටුවා, ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම්, පහතට පනින්න; උන් වහන්සේ සිය දූතයන්ට ඔබ ගැන අණ දෙනු ඇත.ඔබේ පය කිසිසේත් ගලක නොවදින පිණිස,ඔව්හු සිය අත්වලින් ඔබ උසුලනු ඇතැ" යි ලියා තිබේ ය" යි උන්වහන්සේට කී ය. ජේසුස්වහන්සේ ද කතා කොට, තාගේ දෙවි ස්වාමින්වහන්සේ පරීක්ෂා නොකරන්න කියාත් ලියා ඇතැ යි වදාළ සේක. යළික් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා ලෝකයේ සියලු රට රාජ්‍යයන් සහ ඒවායේ යසශ්‍රීය උන්වහන්සේට පෙන්වා ඔබ දණින් වැටී මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කී ය. එවිට ජේසුස්වහන්සේ කතා කරමින් සාතන් පලා යව නුබේ දෙවි ස්වාමින්වහන්සේට නමස්කාරකරන්න උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා ඇතැ යි ඔහුට වදාළ සේක.

මතෙව් 4: 3-10

# ජේසුස්වහන්සේ ශ්‍රාවකයන් කැඳවීම

උන්වහන්සේ ගලීලයේ මුහුද අද්දර ඇවිදින විට සීමොන් ද ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද මුහුදෙහි දැලක් දමනු දුටු සේක.ඔව්හු මසුන් අල්ලන්නෝ වූ හ. ජේසුස්වහන්සේ ඒ දැක, “මා අනුව එන්න; මම ඔබ මිනිසුන් දිනාගන්නන් කරමි”යි වදාළ සේක.එකෙණෙහි ම ඔව්හු දැල් හැරදමා උන්වහන්සේ අනුව ගියහ.උන්වහන්සේ එතැනින් මඳ දුරක් ගොස් සෙබදීගේ පුත් ජාකොබ් ද ඔහුගේ සහෝදර ජොහන් ද ඔරුවක හිඳ දැල් සකස් කරනු දැක, එකෙණෙහි ම ඔවුන් කැඳවා වදාළ සේක. ඔව්හු ද තම පිය සෙබදී මෙහෙකරුවන් සමග ඔරුවෙහි සිටිය දී ම උන්වහන්සේ අනුව ගියහ.

මාක් 1 : 16-20

උන්වහන්සේ මග වඩින විට,අල්පෙවුස්ගේ පුත් ලෙවී නැමැත්තා රේගු පොළේ හිඳිනු දැක,“ මා අනුව එන්නැ” යි ඔහුට වදාළසේක. ඔහු නැගිට උන්වහන්සේ අනුව ගියේ ය.

මාක් 2 :14

උන්වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැගී දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක. පහන් වූ කල උන්වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවා,ඔවුන් අතරෙන් දොළොස් දෙනෙකු තෝරාගෙන, ඔවුන්ට ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක.

ලූක් 6 :12බී -13

තවද, ජේසුස්වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් යුක්ත ව ගලීලයට පෙරළා වැඩිය සේක. උන්වහන්සේ පිළිබඳ ආරංචිය අවට මුළු පෙදෙස පුරා පැතිරිණි. උන්වහන්සේ සියල්ලන්ගෙන් ප්‍රශංසා ලබමින්, ඔවුන්ගේ ධර්මශාලාවල ඉගැන්වූ සේක. උන්වහන්සේ තමන් ඇතිදැඩි වූ නාසරෙත් නුවර ට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැඟිට සිටි සේක. එවිට දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය උන් වහන්සේට දෙන ලද්දේ ය. උන්වහන්සේ ග්‍රන්ථය දිගහැර, මෙසේ ලියා ඇති තැන සොයාගත් සේක. සමිඳාණන්වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්ටත්, පීඩිත වූවන් මුදන්ටත්, සමිඳාණන්වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක... උපස්ථායක තැනට දී වැඩහුන් සේක. එකල ධර්මශාලාවෙහි සිටි සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි නෙත් යොමා සිටියහ. උන්වහන්සේ ඔවුන්ට කතා කරන්න පටන් ගෙන, "අද ඔබ සවන් දී සිටිය දී ම මේ ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වී ය" යි වදාළ සේක. සියල්ලෝ ම උන්වහන්සේ ට ප්‍රශංසා කරමින්, උන්වහන්සේගේ මුවින් පහළ වූ කාරුණික වචන ගැන පුදුම ව මේ ජෝසෙප්ගේ පුතා නොවේ දැ" යි කීහ.

ලූක් 4: 14-22 ඒ

ඔව්හු ජෙරුසලමට පැමිණියෝ ය.උන්වහන් 'සේ දේව මාලිගාවට පිවිස එහි වෙළහෙළදාම් කළවුන් පිටතට පලවා හරින්න පටන්ගෙන, මුදල් මාරු කරන්නන්ගේ මේස ද පරෙවි වෙළෙඳුන්ගේ ආසන ද පෙරළා දමා, දේව මාලිගාව මැදින් කිසිදු දෙයක් ගෙන යන්න කිසිවෙකුට ඉඩ නුදුන් සේක.උන්වහන්සේ ඔවුන්ට උගන්වමින්,"මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා වේ ගෘහයකැ"යි කියනුලබනබව ලියා නැද් ද?එහෙත් ඔබ එය හොරුන්ගේ ගුහාවක් කර ඇතැ යි වදාළ සේක.

මාක් 11 :15,17

ජේසුස්වහන්සේ පාපය ගැන ඉගැන්වීම

එලෙස ම ඔබත් මිනිසුන් අබිමුවෙහි පෙනුමට පිටතින් සිල්වත් ය.එහෙත්,ඇතුළතින් කුහක කමින් හා දාමරිකකමින් පිරී සිටින්නහු ය.

මතෙව් 23 :28

එහෙත්,කටින් පිටවෙන දේ නික්මෙන්නේ සිතින් ය;මිනිසා කෙලෙසනු ලබන්නේ එයින් ය.නපුරු චේතනා මිනීමැරුම්,කාමරාග,සල්ලා ලකම්, සොරකම්, බොරු සාක්ෂි සහ අපහාස නික්මෙන්නේ හදවතින් ය. මතෙව් 15 :18-19

ජේසුස්වහන්සේ පිළිතුරුදෙමින්,"ඒකාන්තයෙන් මම ඔබට කියමි.පව් කරන හැම කෙනෙක් ම පාපයට වහලෙකි. එබැවින් පුත්‍රයාණෝ ඔබ නිදහස් කරන සේක් නම් ඔබ සැබැවින්ම නිදහස් ය. ජොහන් 8 : 34,36

ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි;යමෙක් නැවත නූපන්නොත්, ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකි ය"යි ඔහුට වදාළ සේක. ඔබ නැවත උපදින්නට ඕනෑය යි" මා කීවාට පුදුම නොවන්න. "දෙවියන් 'වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්,ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියලුදෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය.

ජොහන් 3 :3,7,16

පියාණන්වහන්සේ මළවුන් උත්ථාන කොට ජීවත් කරවන්නාක් මෙන්,පුත්‍රයාණෝ ද තමන්ට අභිමත වුවන් ජීවත් කරවන සේක."ඒකාන්ත යෙන්ම මම ඔබට කියමි:මාගේ වචනය අසා,මා එවා වදාළ තැනැන්වහන්සේ අදහාගන්නාට සදාතන ජීවනය ඇත; ඔහු විනිශ්චයට නොපැමිණෙයි; ඔහු මරණයෙන් ජීවනයට පැමිණ සිටියි.

ජොහන් 5 :21,24

එබැවින් යමෙක් ක්‍රිස්තුන්වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහ ව ගොස් ඇත. දැන් සියල්ල ම අලුත් වී තිබේ.

2 කොරින්ති 5 : 17

# ජේසුස්වහන්සේ ජීවන දායක වතුර

සිකාර් නම් සමාරියේ නගරයකට පැමිණි සේක.ජාකොබ්ගේ ළිඳ එහි විය.ගමන් විඩාවෙන් සිටි උන්වහන්සේ ළිඳ ළඟ හිඳගත් සේක.එය මධ්‍යාහ්න වේලා ව පමණ විය.සමාරිය ස්ත්‍රියක් වතුර අදිනු පිණිස පැමිණියා ය."මට වතුර ටිකක් දෙන්නැ"යි උන්වහන්සේ ඇයට වදාළ සේක. එවේලේ, උන්වහන්සේගෙ ශ්‍රාවකයෝ කෑම මිලයට ගනු පිණිස,නගරයට ගොස් සිටියෝ ය.සමාරිය ස්ත්‍රිය ද,"ජුදෙව්වකු වන ඔබ, සමාරීය ස්ත්‍රියක වන මගෙන් බොන්නට ඉල්ලන්නේ, කෙසේදැ"යි උන්වහන්සේගෙන් ඇසුවා ය.එසේ කීවේ,ජුදෙව්වරුන් හා සමාරීයයන් අතර ගනුදෙනුවක් නුවුබැවිනි. ජේසුස්වහන්සේ ඇයට පිළිතුරු දෙමින්,"දෙවියන්වහන්සේගේ දීමනාවත්,මට වතුර ටිකක් දෙන්නැයි ඔබට කියන්නේ කවරෙක් ද කියාත් ඔබ දැන සිටියෙහි නම්,ඔබ ඔහුගෙන් ඉල්ලනු ඇත;එවිට ඔහු ජීවන ජලය ඔබට දෙනු ඇතැ"යි වදාළ සේක. ජේසුස්වහන්සේ ඇයට පිළිතුරු දෙමින්,"මේ වතුර බොන හැම කෙනෙකුට ම නැවත පිපාසය ඇති වන්නේ ය.එහෙත් මා දෙන වතුර බොන කවර කෙනෙකුට වුවත් කිසි කලෙක පිපාසය ඇති නොවන්නේය.මා ඔහුට දෙන වතුර සදාතන ජීවනය පිණිස ඔහු තුළ දිය උල්පතක් වන්නේය"යි වදාළ සේක.

ජොහන් 4 :5-10,13-14

"එහෙයින් යමෙක් මාගේ වචන අසා,ඒවා පිළිපදී ද, ඔහු පර්වතය මත තමාගේ ගෙය තනාගත් නැණවතෙකුට සමාන ය.වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසී ය.එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි. තවද, යමෙක් මාගේ මේ වචන අසා, ඒවා නොපිළිප දී ද, ඔහු වැලි මත ගෙය තනාගත් අනුවණ මනුෂ්‍යයෙකුට සමාන ය.වැසි වැස, ජලය ගලා සුළඟ හමා ඒ ගෙට ගැසී ය.එය බිඳ වැටිණි.එහි වැටීම ද භයංකර විය."

මතෙව් 7 :24-27

"ඔබ අතුරෙන් බැටළුවන් සියයක් ඇති කවර මනුෂ්‍යයෙක්, උන්ගෙන් එකෙකු නැති වුවහොත්, අනූ නව දෙනා පාළුකරයෙහි හැරදමා,නැති වූ එකා පසුපස්සේ ගොස්, ඌ සම්බ වන තුරු සොයන්නේ නැද් ද? ඒ බැටළුවා සම්බ වූ විට ඔහු ් ප්‍රීති වෙමින්,ඌ කර තබාගෙන, ගෙදර අවුත් මිතුරන් ද අසල්වැසියන් ද කැඳවා මා සමග ප්‍රීති වන්න,මාගේ නැති වූ බැටළුවා සම්බ වී ය යි ඔවුන්ට කියයි. එලෙස ම පසුතැවී සිත් හරවා ගැනීමට වුවමනා නැතැ යි සිතන සිල්වතුන් අනූ නව දෙනෙකුට වඩා පසුතැවී සිත හරවා ගන්න එක පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇති වන්නේ යයි මම ඔබට කියමි".

ලූක් 15 :4-7

# ජේසුස්වහන්සේ ආශිර්වාද ලැබීම ගැන ඉගැන්වීම

යේසුස්වහන්සේ ජනකාය දැක කන්දකට නැගු නු සේක.උන්වහන්සේ වැඩහුන් කල ශ්‍රාවකයෝ උන්ව හන්සේ වෙත ආහ. එවිට උන්වහන්සේ ඔවුන්ට උගන්වමින් මෙසේ වදාළ සේක:බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය;ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය. ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය; වුන් සැනසීම ලබන්නෝ ය. නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දේශය උරුම කර ගන්නෝ ය. යුක්තියට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු තෘප්තිමත් වන්නෝ ය; දයාවන්තයෝ භාග්‍ය වන්තයෝ ය; ඔව්හු දයාව ලබන්නෝ ය.නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දෙවියන්වහන්සේ දකින්නෝ ය.සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය;ඔව්හු දෙවියන් වහන්සේගේ ය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය; මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩා කොට, නානා විධ අසත්‍ය චෝදනා නගන කල ඔබ භාග්‍යවන්තයෝ ය;ප්‍රීති ප්‍රමෝද වන්න; මන්ද,ස්වර්ගයෙහි ඔබේ පල විපාකය ඉමහත් ය.

මතෙව් 5 :1-12 ඒ

දෙවියන්වහන්සේගේ වචනය අසා එය පිළිප දින අය ඊටත් වඩා භාග්‍යවන්ත ය යි වදාළ සේක. ලූක් 11 : 28 බී

නොකඩවා යාච්ඤාවෙහි යෙදිය යුතු බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට මේ උපමාව වදාළ සේක: ලූක් 18 : 1 බී

"මිනිසුන් දෙදෙනෙක් යාච්ඤාව පිණිස දේව මාලිගාවට නැගී ගියහ; එක් කෙනෙක් පරිසිවරයෙකි; අනික් තැනැත්තා අයකැමියෙකි. පරිසිවරයා නැගී සිට පසෙකට වී තනියම යාච්ඤා කරමින්, දෙවියන්වහන්ස, මා අන් මිනිසුන් මෙන් වස්තු ලෝභී, වංචනික කාමමිථ්‍යාචාරී තැනැත්තකු නොවන බැවින් ඔබට තුති පුදමි. මම මේ අයකැමියා වැන්නෙක් ද නොවෙමි. සතියකට දෙවරක් උපවාස කරමි; මා උපයන සියල්ලෙන් දහයෙන් කොටස දෙමි"යි කී ය. එහෙත් අයකැමියා ඈතින් සිට ස්වර්ගය දෙස ඇස් ඔසවා බලන්නට වත් නොසිතා, තමාගේ ළයට ගසාගනිමින්, "දෙවියන්වහන්ස, පව්කාර වූ මා හට කරුණා කළමැනවැ"යි කී ය. මෙය මම ඔබට කියමි; දමිටු යයි ගණන් ගනු ලැබ ගෙදර ගියේ පරිසිවරයා නොව, මේ අයකැමියා ය. තමා ම උසස් කරගන්නා හැම දෙන ම පහත් කරනු ලබති; තමා ම පහත් කරගන්නා උසස් කරනු ලබන්නේ ය.

ලූක් 18 : 10-14

එවිට ජේසුස්වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට මෙසේ වදාළ සේක:" යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරමින් මා අනුව ඒවා! මන්ද,සිය දිවි රැකගන්න කැමැති තැනැත්තේ ඒ නැති කරගන්නේ ය.මා උදෙසා සිය දිවි නැති කරගන්නා එය රැකගන්නේ ය. යමෙකු මුළු ලෝකය ම ලබාගත්තත්, සිය දිවි නැති කරගත්තොත් ඔහුට කිනම් ප්‍රයෝජනයක් ද? මතෙව්16 : 24-26 එ

එමෙන් ම ඔබ අතුරෙන් තමන් සතු සියල්ල අත් නොහරින කිසිවෙකුට මාගේ ශ්‍රාවකයෙකු වන්නට බැරි ය. ලූක් 14 :33

"මාගේ ආඥාව නම්:' මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න' යනුයි. ජොහන් 15 : 12

ඔබ එකිනෙකාට ප්‍රේම කරන්නහු නම්, එයින් ඔබ මාගේ ශ්‍රාවකයන් බව සියල්ලෝ දනිගනිති යි වදාළ සේක. ජොහන් 13 : 35

එබැවින්,තමන්වහන්සේ අදහාගත් ජුදෙව්වරුන් ට ජේසුස්වහන්සේ කතා කොට"ඔබ මාගේ ධර්ම යෙහි පිහිටා පවතින්නහු නම්,සැබැවින් ම ඔබ මාගේ ශ්‍රාවකයෝ ය; ජොහන් 8 : 31

මාගේ පියාණන්වහන්සේ මහිමයට පමුණුවනු ලබන්නේ, ඔබ බොහෝ සේ පලදරමින් මාගේ ශ්‍රාවකයන් වීමෙන් ය.

ජොහන් 15 : 8

"ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, 'ස්වාමිනි, ස්වාමිනි' යි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය.

මතෙව් 7 : 21

ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුවොත්,කිසි සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නාහු ය. මතෙව් 18 : 3 බී

"පටු දොරටුවෙන් ඇතුළු වන්න.විනාශයට යන දොරටුව විශාල ය, පාරත් පළල්ය.එයින් ඇතුළු වන්නෝ ද බොහෝ ය. එහෙත්,ජීවනයට යන දොරටුව පටු ය; පාර ද අවහිර ය; එය සොයා ගන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි."

මතෙව් 7 : 13 14

"ඔබේ සිත් නොකැළඹේ වා! දෙවියන්වහන්සේ අදහාගන්න මා ද අදහාගන්න. මාගේ පියාණන්වහන්සේගේ නිවාසයෙහි වාසය කිරීමට ඉඩපහසු තැන් බොහෝ ඇත. එසේ නොවේ නම් ඒ බව මම ඔබට නොකියම් ද? ඔබට ස්ථානයක් සූදානම් කරන පිණිස යමි. මා ගොස් ඔබට ස්ථානයක් සූදානම් කළ විට, මා සිටින තැන ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි.

ජොහන් 14 :1-3

ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක ආහාර ය මම ය. යමෙක් මේ ආහාරයෙන් වැළඳුවොත්, ඔහු සදහට ම ජීවත් වන්නේ ය. මා විසින් දෙනු ලබන ඒ ආහාරය මාගේ මාංසය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිස ය යි වදාළ සේක.

ජොහන් 6 : 51

දොරටුව මම ය; මා තුළින් යමෙක් ඇතුළුවන්නේ ද ඔහු ගළවනු ලැබ ඇතුළට හා පිටතට ගොස් ආහාර ලබන්නේ ය. "යහපත් එඬේරා මම වෙමි. යහපත් එඬේරා, තම ජීවිතය බැටළුවන් උදෙසා පුජා කරන්නේ ය.

ජොහන් 10 : 9,11

"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි; මා මඟින් මිස කිසිවෙක් පියාණන්වහන් සේ වෙත නොපැමිණෙන්නෝ ය."

ජොහන් 14 :6 බී

"ලෝකයේ ආලෝකය මම ය; මා අනුගමනය කරන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝක ය ලබන්නේ ය"යි වදාළ සේක.

ජොහන් 8 : 12බී

ගුරුදේවයෙනි, ස්වාමිනි' කියා ඔබ මා අමතන්නු ය. එසේ කීම හරි ය; මම එසේ ම වෙමි.

ජොහන් 13 : 13

ඔව්හු සියල්ලෝ," එසේ නම් ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ දැ" යි ඇසූ හ. උන් වහන්සේ ද , 'මා එසේ බැව් පවසන්නේ ඔබ මා ය' යි වදාළ සේක.

ලූක් 22 : 70

එකල ලාදුරු රෝගීයෙක් උන්වහන්සේ වෙත අවුත්,වැඳ වැටී, “ස්වාමිනි,ඔබ කැමති සේක් නම්, මා පවිත්‍ර කරන්න ඔබට පුළුවනැ” යි කී ය. උන්වහන්සේ අත දිගු කොට, ඔහු පිට තබා, “ මම කැමැත්තෙමි, පවිත්‍රවන්නැ” යි වදාළ සේක. එකෙණෙහි ම ඔහුගේ ලාදුරු රෝගය සුව විය. මතෙව් 8 : 2-3

එහි දසඅට වසක් තිස්සේ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු, කොයි අන්දමකින්වත් කෙළින් වෙන්නට බැරි ස්ත්‍රියක් වුවා ය. ජේසුස්වහන්සේ ඈ දැක කැඳවා, “ස්ත්‍රිය, ඔබේ දුර්වල කමින් ඔබ මිදුණෙහිය” යි කියා ඈ පිට අත තැබූ සේක. එකෙණෙහි ම ඈ කෙළින් සිට, දෙවියන්වහන්සේට ප්‍රශංසා කළාය.

ලූක් 13 : 11-13

මහත් ජනකායක්, කොරුන් ද අබ්බගාත යන් ද අන්ධයන් ද ගොළුවන් හා වෙනත් බොහෝදෙනෙකුන් ද රැගෙන, ජේසුස්වහන් සේ වෙත අවුත් ඔවුන් උන්වහන්සේගේ පාමුල තැබූ හ.උන්වහන්සේ ඔවුන් සුවපත් කළ සේක.

මතෙව් 15 : 30

සීමොන්ගේ භාර්යාවගේ මව උණෙන් ඔත්පළ ව සිටියා ය. ඔව්හු වහා ම ඇය ගැන උන්වහන්සේට දැන්වූ හ. උන්වහන්සේ ඇය වෙතට ගොස් ඇගේ අතින් අල්ලා ඇය නැඟිටෙවූ සේක. ඇගේ උණ බැස ගියේ ය. ඈ ඔවුන්ට උපස්ථාන කළා ය. මාක් 1 : 30-31

තණ කොළ මත හිඳගන්නට ජනකායට අණ කොට, උන්වහන්සේ රොටි පහත්,මසුන් දෙදෙනාත් ගෙන, ස්වර්ගය දෙස බලා ආශිර්වාදය පවසා, රොටි කඩා ශ්‍රාවකයන්ට දුන් සේක.ශ්‍රාවකයෝ ද එය සෙනගට දුන්හ. හැම දෙනම කා තෘප්තියට පැමිණියහ. ඔව්හු ඉතිරි කැබලි එක් කොට කුඩා දොළසක් පුරවාගත්හ.ස්ත්‍රීන් හා දරුවන් හැර කෑම කෑ පුරුෂයෝ පන්දහසක් පමණ වූ හ.

මතෙව් : 14 :19-21

අලුයම තුනටත් හයටත් අතර උන්වහන් 'සේ ඔවුන් වෙත මුහුද මතුපිට ඇවිදගෙන ආ සේක. ශ්‍රාවකයෝ උන්වහන්සේ මුහුද මත ඇවිදගෙන එනු දැක, කළඹල වී,“ ඒ අවතාරයක් කෑ” යි කියමින්, බියෙන් මොරගැසූ හ. එහෙත්, ජේසුස්වහන්සේ වන්න;මේ මම ය;බිය නොවන්නැ”යි වදාළ සේක.

මතෙව් 14 : 25-27

එවිට චණ්ඩ මාරුතයක් හමා, ඔරුව පිරී යන තරමට එයට රැළ ගැසී ය. උන්වහන්සේ ඔරුවේ අවරයෙහි,මෙත්තය මත නිදා හුන් සේක. ඔව්හු උන්වහන්සේ පුබුදුවා, “ගුරුදේවයෙනි, අප විනාශ වන්න ළඟ ය, ඔබට කිසි ගණනක් නැද්දැ” යි ඇසූ හ. උන්වහන්සේ අවදි ව සුළඟට තර්ජනය කොට,නිශ්ශබ්ද වෙව,නිශ්චල වෙව”යි මුහුදට අණ කළ සේක. සුළඟ නැවතිණි. මහා නිශ්චලයක් විය.

මාක් 4 : 37-39

එහෙත්,පොළොවෙහි දී පව් කමා කිරීමේ බලය, මනුෂ්‍ය පුත්‍රයාණන්ට තිබෙන බව ඔබට පෙන්වා දෙමි යි කියමින් " නැගිට ඔබේ යහන රැගෙන ගෙදර යන්නැ" යි අංසබාග රෝගීයාට වදාළ සේක. එවිට ඔහු නැගිට ගෙදර ගියේ ය. මතෙව් 9 : 6-7

එවිට උන්වහන්සේ, " ඔබේ පව් ඔබට කමා කරන ලදැ"යි ඇයට වදාළ සේක. උන්වහන්සේ සමග කෑමට සිටි අය," පව් කමාව පවා දෙන මොහු කවරෙක්දැ" තම තමන් අතර විමසූ හ. ලූක් 7 : 48-49

එහෙයින්, සහෝදරයෙනි, උන්වහන්සේ කරණ කොටගෙන පව් කමාව අප ඔබට ප්‍රකාශ කරන බව දැන ගන්න. මොසෙස්ගේ ව්‍යවස්ථාවෙන් ඔබට ලබා ගත නොහැකි වූ පාපයෙන් නිදහසදැන් උන්වහන්සේ අදහන සෑමට ම සෑම අතින් ම අත් වන්නේ ය.

ක්‍රියා 13 : 38-39

ක්‍රිස්තුන්වහන්සේගේ යාගික රුධිරය කරණ කොටගෙන, දෙවියන්වහන්සේගේ වරප්‍රසාද සම්පතේ ප්‍රකාරයට අපට මිදීමත්, පව් කමාවත් ලැබී ඇත. එපීස 1 : 7

එහෙත් අපි පාපොච්චාරණය කරමු නම්,විශ්වාසවන්ත වූ ද ධර්මිෂ්ඨ වූ ද,දෙවියන්වහන්සේ සියලු පාපවලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක.

1 ජොහන් 1 : 9

# ජේසුස්වහන්සේට යක්ෂ ආත්ම කෙරෙහි බලය තිබීම

අශුද්ධාත්මයාක් අවේශ වු මිනිසෙක් ධර්ම ශාලාවෙහි සිටියේ ය. ඔහු මහ හඬින් මොරගසා, අහෝ! නාසරෙත්හි ජේසුස් තුමෙනි ඔබත් අපත් අතර මොන ගනුදෙනුවක් ද? ඔබ ආවේ අප වනසන්ට ද? ඔබ කවරෙක්ද යි දනිමි. ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධවරයාණෝ ය යි කීය. ජේසුස්වහන්සේ ඔහුට තරවටු කරමින්, "කට පියාගෙන මොහුගෙන් දුරු වෙව"යි වදාළ සේක.එවිට දුෂ්ටාත්මය සමුහයා ඉදිරියෙහි ඔහු බිම හෙළා ඔහුට තුවාළ නොකොට ඔහුගෙන් දුරු වී ය. සියල්ලෝම විස්මිත ව මේ මොන ධර්මයක් ද? මෙතුමා බලධාරී ව ද මහානුභාව ඇතිවද අශුද්ධාත්මයන්ට අණ දෙන සේක; ඔව්හු පලා යති" යි තම තමන් අතර කතා කරගත් හ.

ලූක් 4 : 33-36

ඒ දරුවා එද්දි ම,දුෂ්ටාත්මය ඔහු බිම හෙළා දමා, දැඩි ලෙස ඔහු සලිත කෙළේ ය. එහෙත් ජේසුස්වහන්සේ අශුද්ධාත්මයට තරවටු කොට, දරුවාට සුවය දී, ඔහු පියාට භාර දුන් සේක. ඔවුන් සියල්ලෝ ම දෙවියන්වහන්සේගේ මහා නුභාවය ගැන විස්මිත වු හ.

ලූක් 9 : 42-43

"ගල ඉවත් කරන්නැ"යි ජේසුස්වහන්සේ වදාළ සේක. "ස්වාමිනි, ඔහු මියගොස් සතර දිනකි, දැන් දුගඳත් ඇතැ" යි මළ තැනැත්තාගේ සො හොයුරියක වූ මාර්තා කීවා ය. ජේසුස්වහන්සේ කතාකොට, " ඔබට ඇදහිල්ල ඇත්නම් ඔබ දෙවියන්වහන්සේගේ තේජශ්‍රීය අත්දකින බව මා කීවා නොවේ දැ"යි ඈට වදාළ සේක. උන්වහන් සේ මෙසේ කියා ,"ලාසරස් පිටතට එන්නැ" යි මහ හඬින් වදාළ සේක. මැරී සිටි තැනැත්තා පිටතට ආවේ ය; ඔහුගේ අත් පා රෙදි පටිවලින් වෙළා තිබුණේ ය.මුහුණ රෙදි කඩකින් ඔතා තිබුණේ ය."මොහුගේ බැම් ලිහා,යන්නට හරින්නැ" යි ජේසුස්වහන්සේ වදාළ සේක.

ජොහන් 11 : 39-40, 43-44

උන්වහන්සේ නුවර දොරටුවට ළං වූ කල,මළ මිනියක් පිටතට ගෙනෙන ලද්දේ ය. මළ තැනැත්තේ,සිය මවගේ එක ම පුත්‍රයාය. ඈ ද වැන්දඹුවකි. නුවරවාසී විශාල පිරිසක් ඈ සමඟ ආහ. සමිදාණන් වහන්සේ ඈ දැක අනුකම්පා කොට, "හැඬීම නවත්ව න්නැ"යි වදාළසේක. උන්වහන්සේ ළං වී දෙණට අත තැබූ සේක.එවිට දෙණ උසුලන්නෝ නැවතුණාහ. උන්වහන්සේ, "යෞවනය, නැගිටින්නැ යි මම ඔබට කියමි" යි වදාළ සේක. එවිට මළ මිනිසා නැගිට හිඳගෙන කතා කරන්න පටන්ගත්තේ ය.

ලූක් 7:12-15ඒ

'මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියත් දැ' යි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසු සේක.ඔව්හු කතා කොට,"සමහරෙක්, ස්නාවක ජොහන් ය කියා ද සමහරකේ 'එලියා ය' කියා ද, අන් සමහරෙක් 'ජෙරෙමියා නොහොත් දිව්‍යවැසිවරයන්ගෙන් කෙනෙක්ය' කියා ද කියති" යි කීහ."එහෙත් ඔබ මා කවරෙකු කියා කියන්නහුදැ" යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසු සේක. සීමොන් පේදුරු උත්තර දෙමින්,"ඔබ ක්‍රිස්තුවරයාණෝය, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය" යි කී ය. ජේසුස්වහන්සේ උත්තර දෙමින්," ජෝනාගේ පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්ත ය. මන්ද, ස්වර්ගයෙහි වැඩවසන මාගේ පියාණන්වහන්සේ විසින් මිස මනුෂ්‍ය මඟකින් මෙය ඔබට එළිදරව් නො කරන ලද්දේය. මතෙව් 16 : 13 බි -17

ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්, " ඔහුට දුෂ්ටා ත්මයක් වැහී ඇත;සිහිවිකල වී ඇත;ඔහුට කන්දෙන්නේ කුමට දැ" යි කීහ. "මේවා දුෂ්ටාත්මාවේශ වුවකුගේ කීම් නොවේ; අන්ධයන්ගේ ඇස් පහදන්නට දුෂ්ටාත්මයකට පුළුවන්දැ" යි සෙසු අය කී හ. ජොහන් 10 : 20-21

මරියා වෙතට ආ ජුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් ජේසුස්වහන්සේ කළ දේ දැක උන්වහන් සේ අදහාගත්හ.එහෙත් ඔවුන්ගෙන් ඇතැමෙක් පරිසිවරුන් වෙත ට ගොස් ජේසුස්වහන්සේ කළ දේවල් ඔවුන්ට සැල කළහ. එබැවින් එදා පටන් ඔව්හු උන්වහන්සේ මරන්නට කුමන්ත්‍රණය කළහ.

ජොහන්11:45-46,53

එවිට උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මුලිකයන් ද නායක පූජකයන් ද විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නටත් මරනු ලබන්නටත්, තෙ දිනකට පසු නැවත නැගිටින්නටත් නියම බව ඔවුන්ට උගන්වන්න පටන්ගත් සේක. මාක් 8 :31

තවද මා පොළොවෙන් ඔසවනු ලැබූ කල, සියල්ලන් මා වෙතට ඇදගන්නෙමි" යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාළේ, තමන්වහන්සේ විඳින්නට යන්නේ කෙබඳු මරණයක් දැ යි හඟවන පිණිස ය.

ජොහන් 12 : 32-33

ජේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "මේ දේව මාලිගාව කඩාදමන්න. තෙදිනකින් එය මම ගොඩනඟන්නෙමි" යි වදාළ සේක. එවිට ජුදෙව්වරු කතා කොට, " මේ දේව මාලිගාව ගොඩනඟන්නට හතළිස් හය වසක් ගත විය. ඔබ එය තෙදිනකින් ගොඩනඟන්නෙහි දැ" යි ඇසූහ. එහෙත්, උන්වහන්සේ කතා කෙළේ, තමන්ගේ ශරීරය නමැති දේව මාලිගාව ගැන ය. උන්වහන්සේ මරණින් නැගිටුවනු ලැබූ පසු ,ශ්‍රාවකයෝ, උන්වහන්සේ මේ දේ කී බව සිහි කොට ශුද්ධ ලියවිල්ල ද උන්වහන්සේගේ වචනය ද විශ්වාස කළහ.

ජොහන්2 : 19-22 ඒ

පසු දා මංගල්‍යයට පැමිණ සිටි මහා සමූහයක් ජේසුස්වහන්සේ ජෙරුසලමට වඩිනා සේක යි අසා, තල් අතු රැගෙන: "හෝසන්නා! සමිඳාණන්ගේ නාමයෙන් වඩිනා තැනැන්වහන් සේට ආසිරිවේවා! ඉශ්රායෙල් රජු හට ආසිරි වේවා!" යි ඔල්වර හඬ නගමින් උන්වහන්සේගේ පෙරමඟට පැමිණියහ. "සියොන්පුරගන, බිය නොවන්න, මෙන්න! ඔබේ රජ කොටළු වස්සකු පිට නැග එන්නේ ය" යි ලියා තිබෙන ලෙස, උන්වහන්සේ කොටළු නාම්බෙකු සොයාගෙන ඌ පිට හිඳගත් සේක.

ජොහන් 12: 12-15

උන්වහන්සේ අගනුවරට ළඟා වී එය දුටු විට නුවර ගැන හඬමින් මෙසේ වදාළ සේක: අහෝ ඔබට ශාන්තිය සලසන දේ ගැන මේ උදාර දින යේ දී වත් ඔබ දැන සිටියා නම්!' එහෙත් එසේ නොවී ය. එය ඔබේ දෙනෙතින් සැඟවී ඇත. ඔබේ සතුරන් බලකොටු තනා, ඔබ සිසාරා, සතර දිගින් ඔබ වටලන දවස් පැමිණෙන්නේ ය. ඔව්හු ඔබ ද ඔබ තුළ සිටින දරු කැල ද පොළොවේ ගසා, ගලක් පිට ගලක් තිබෙන්ට ඉඩ නාරින්නෝ ය. මන්ද, දෙවියන්වහන් සේ ඔබ ගළවන්නට පැමිණි දවස ඔබ නොදත් හෙයිනි.

ලූක් 19 : 41- 44

පසු දින ජොහන් තෙමේ ජේසුස්වහන්සේ තමා සමීපයට වඩිනු දැක,“මෙන්න, ලෝකයේ පාපය දුරලන දෙවියන්වහන්සේගේ බැටළු පෝතක යාණෝ! ජොහන් 1 : 29බී

පාස්කු බැටළුවා පුජා කළ යුතු නුමුහුන් රොටි මංගල්‍යය පවත්වන දවස පැමිණියේ ය.එවිට උන්වහන්සේ පේදුරු ද ජොහන් ද යවමින්“ඔබ ගොස් අප විසින් පාස්කු භෝජනය වළඳ න පිණිස පිළියෙළ කරන්නැ” යි වදාළ සේක. උන්වහන්සේ රොටි ගෙන තුති පුදා,ඒවා කඩා, ඔවුන්ට දී,“ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය; මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ”යි වදාළ සේක. උන්වහන්සේ කුසලානක් ද ගෙන තුති පුදා, ඔවුන්ට දුන් සේක.සියල්ලෝම එයින් පානය කළහ.තවද උන්වහන්සේ ඔවුන්ට කතා කොට,මෙය බොහෝ දෙනා වෙනුවෙන්වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ.

ඔබගේ පියවරුන්ගෙන් ලැබූ නිෂ්ඵල ජීවිත මාර්ගයෙන් ඔබ මුදනු ලැබුවේ රන් රිදී වැනි දිරා යන දේවල් මගින් නොව,කැළලක් වත්' පලුද්දක් වත් නැති බැටළු පැටවකුගේ ලේ වැනි ක්‍රිස්තුන්වහන්සේගේ අගනා ලෙය කරණකොටගෙන බව ඔබ දන්නහු ය.

1පේදුරු 1:18-19

දොළොස් දෙනාගෙන් එක් කෙනෙකු වු ජුදස් ඉස්කාරියොත් ජේසුස්වහන්සේ නායක පුජකවරුන්ට පාවා දෙනු පිණිස ඔවුන් වෙතට ගියේ ය.ඔව්හු එපවත් අසා තුටුපහටු වී ඔහුට මුදල් දෙන්න ට පොරොන්දු වුන්හ.

මාක් 14 : 10-11ඒ

එකල ජේසුස්වහන්සේ ඔවුන් හා සමග ගෙත් සෙමන නම් වු තැනට පැමිණ "මා එතැනට ගොස් යාච්ඥා කරන අතර ඔබ මෙහි සිටින්නැ"යි සිය ශ්‍රාවකයන්ට වදාළ සේක.උන්වහන්සේ පේදුරු ද සෙබදීගේ පුත්‍රයන් දෙදෙනා ද කැඳවාගෙන ගිය සේක.ඉන්පසු උන්වහන්සේ ශෝක වන්ටත් සන්තාප වන්ටත් පටන්ගත් සේක. අහෝ මාගේ පියාණෙනි,හැකි නම් මේ කුසලාන මා කෙරෙන් පහකළ මැනව.එහෙත් මාකැමති ලෙස නොව, ඔබ කැමති ලෙස වේ වා"යි යාච්ඥා කළ සේක.

මතෙව් 26: 36-37,39

ජුදස් තෙමේ,නායක පුජකයන්ගෙන් ද පරිසිවරු න්ගෙන් ද භට කණ්ඩායමක් සහ මුර සේවකයන් කීප දෙනෙකුත් ලබාගෙන, පහන්,පන්දම් හා අවි ආයුධ ඇති ව එතැනට පැමිණියේ ය. එකල භට කණ්ඩායම ද ඔවුන්ගේ මහා සේනාධිපතියා ද ජුදෙව්වරුන්ගේ මුර සේවකයෝ ද ජේසුස්වහන්සේ අල්ලා, බැඳගෙන.

ජොහන් 18: 3,12

# ජේසුස්වහන්සේ කුරුසිපත් කිරීමට තීන්දු කිරීම

පහන් වූ කල සියලු නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද ජේසුස්වහන්සේ මරණයට පත් කරන පිණිස උන්වහන්සේට විරුද්ධ ව මන්ත්‍රණය කළහ. ඔව්හු උන්වහන්සේට විලංගුලා ගෙන ගොස් ආණ්ඩුකාර පිලාත්ට භාර දුන්හ.එසේ නම් ක්‍රිස්තුස් ය කියන ජේසුස්ට මා කුමක් කරන්න දැ" පිලාත් ඔවුන්ගෙන් ඇසී ය. "ඔහු කුරුසියේ ඇණ ගසන්නැ' යි සියල්ලෝ ම එක හඬින් කී හ.

මතෙව් 27 : 1-2,22

ඔවුන් උන්වහන්සේ කුරුසියෙහි ඇණ ගැසුවේ හිරු උදා වී තුන් පැයකට පසුව ය. ජුදෙව්වරුන්ගේ රජ ය යි උන්වහන්සේ පිළිබඳ චෝදනා පුවරුව ලියා තිබිණි. තවද, ඔව්හු සොරුන් දෙදෙනෙකු එක් කෙනෙකු දකුණු පසෙහි ද එක් කෙනෙකු වම් පසෙහි ද උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගැසු හ. උන්වහන්සේ අපරාධකරුවන් සමග ගණන්ගනු ලැබූ සේක.යන ශුද්ධ ලියවිල්ල මෙසේ ඉටු විය.මග යන අය හිස් වන වනා උන්වහන්සේට අපහාස කරමින් හහා! දේව මාලිගාව වනසාදමා තෙදිනකින් එය ගොඩනගන ඔබ මා ගැළවී කුරුසියෙන් බැස එන්නැයි කී හ.එලෙස ම නායක පූජකවරු විනයධරයන් සමග තම තමන් අතර උන්වහන්සේට කවටකම් කරමින්, මොහු අනුන් ගැළවී ය. එහෙත් තමා ම ගළවාගන්නට මොහුට නොහැකි ය.

මාක් 15 : 25-31

මද්දහනේ සිට අපරභාග තුන දක්වා රට පුරා තද අන්ධකාරයක් පහළ විය. ජේසුස්වහන්සේ යළිත් මහහඬින් හඬගා අවසන් හුස්ම හෙළූ සේක. දේව මාලිගාවේ තිරය ඉහළ පටන් පහළ දක්වා දෙකඩ ව ඉරුණේ ය; පොළොව කම්පා විය; ගිරිකුළු දෙදරිණි; ශතාධිපතියා ද ඔහු සමඟ ජේසුස්වහන්සේ මුර කරමින් සිටි අය ද පොළොකම්පාවත් සිදු වූ දේත් දැක ඉතා බියපත් ව "සැබැවින් ම මේ මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ පුත්‍රයා ය" යි කී හ.

මතෙව් 27 : 45,50-51, 54

එබැවින් හේවායෝ අවුත්, පළමුවැන්නාගේත් එමෙන්ම ඔහු සමඟ ඇණ ගසන ලද දෙවැන්නාගේත් කකුල් කඩා දැමූ හ. එහෙත් ඔව්හු ජේසුස්වහන්සේ ළඟට පැමිණි විට උන්වහන්සේ මිය ගොස් සිටින බව දැක, උන්වහන්සේ ගේ කකුල් නොකැඩූ හ. එහෙත්, හේවායන්ගෙන් කෙනෙක් හෙල්ලයකින් උන්වහන්සේගේ ඇලයට ඇන්නේ ය. එකෙණෙහි ම ලේත් වතුරත් ගලා ආවේ ය. එය දුටු තැනැත්තේ ඒ ගැන සාක්ෂි දරයි. ඔහුගේ සාක්ෂිය සැබෑ ම ය. ඔබත් විශ්වාස කරන පිණිස ඔහුගේ සාක්ෂිය සැබෑ බව ඔහු දනියි. මේ දේවල් සිදු වුයේ "ඔහුගේ එක ඇටයක් වත් නොබිඳිනු ලැබේ ය" යි ලියා ඇති ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වන පිණිසය. තවද, ඔවුන් ඇණ තුවාළ කළ තැනැත්තා දෙස බලනු ඇතැයි තවත් ශුද්ධ ලියවිලි පාඨයක් ඇත.

ජොහන් 19 : 32-37

# ජේසුස්වහන්සේ තුන් දිනකට පසුව නැවත නැගිටීම

නායක පුජකවරු ද පරිසිවරු ද පිලාත් වෙත රැස් ව, ස්වාමිනි, ඒ වංචාකාරයා ජීවත් ව සිටිය දී, මම තුන් දවසකට පසු මරණින් උත්ථාන වන්නෙමි යි" කී බව අපට මතක ය.එහෙයින් තුන් වන දවස දක්වා සොහොන් ගෙය ආරක්ෂා කරන්න අණ දුන මැනවි. නැතහොත් සමහර විට ඔහුගේ ශ්‍රාවකයන් අවුත් ඔහු සොරාගෙන ගොස් ,ඔහු මරණින් උත්ථානවී ය යි සෙනගට කියනු ඇත. මෙසේ අවසාන වංචාව මුල් වංචාවට වඩා මහත්වන්නේ ය.යි කී හ. වුවමනා නම්, මුර කණ්ඩායමක් රැගෙන ගොස් සොහොන හැකි පමණ සුරක්ෂිත කොට, තබන්නැ යි" පිලාත් ඔවුන්ට කී ය.ඔව්හු ගොස් සොහොන් ගල පිට මුද්‍රාව තබා,මුර කණ්ඩායම එහි සිටුවා, සොහොන් ගෙය සුරක්ෂිත කළහ. මතෙව් 27 : 62 ඒ -66

සබත් දින නිම වී සතියේ පළමු වන දින එළිවන වේලෙහි මග්දලයායේ මරියා ද අනික් මරියා ද සොහොන් ගෙය බලන්න ගියහ. එවිට මහා භූමිකම්පාවක් විය.සමිදාණන්වහන් 'සේගේ දූතයෙක් ස්වර්ගයෙන් බැස අවුත්, ගල ඉවතට පෙරළා ඒ මත හිඳ ගත්තේ ය.ඔහු ගේ පෙනුම විදුලිය වැනි ය, ඔහුගේ වස්ත්‍ර හිම මෙන් සුදු ය. මුර සෙබළු ඔහුට භයින් වෙවුලා, මළවුන් මෙන් වූ හ. දේව දූතයා ඒ ස්ත්‍රීන්ට කතා කරමින්," බිය නොවන්න, ඔබ කුරුසියෙහි ඇණ ගැසූ,ජේසුස්වහන්සේ සොයන බව දනිමි;උන්වහන්සේ මෙහි නැත; උන්වහන්සේ වදාළ ලෙස ම උත්ථාන වූ සේක.

මතෙව් 28 : 1- 6 ඒ

ශුද්ධ ලියවිලි ප්‍රකාර තුන් වන දා උත්ථාන කරනු ලැබූ බවත්, 1 කොරින්ති 15: 4බී

මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි. කිසිවෙක් එය මගෙන් පැහැර නොගනිති.මාගේ ම කැමැත්තෙන් මම එය පුදමි.එය පුදන්නට මට බලය තිබේ.එය යළි ලබන්නට ද මට බලය තිබේ. මේ නියමය මාගේ පියාණන්වහන්සේගෙන් ම ලදි මි යි වදාළ සේක.

ජොහන් 10 :17බී -18

මහෝත්තම දෙවි ස්වාමින්වහන්සේ මරණය සදහට ම විනාශ කරදමන සේක.

යෙසායා 25 :8 ඒ

ජීවමාන තැනැත්තා ය. මම මැරුණෙමි; එහෙත් බලන්න,මම සදහට ම ජීවත් ව සිටිමි. මරණයේ ද පාතාල ලෝකයේ ද යතුරු මට ඇත. එළිදරව් 1 :18

එම්බා මරණය, තාගේ ජය කොයි ද? එම්බා මරණය, තාගේ විෂ දළය කොයි ද? එහෙත් අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ කරණකොට ගෙන අපට ජය අත් කර දෙන දෙවියන්වහන්සේට ස්තුති වේ වා!

1 කොරින්ති 15 :55,57

මේ ගැන මවිත නොවන්න; මන්ද, සොහොන් ගත සියල්ලන්ට උන්වහන්සේගේ හඬ ඇසෙන පැය පැමිණෙන්නේ ය. එවිට යහපත කළ අය සදාතන ජීවනය සඳහා උත්ථාන කරනු ලබති; අයහපත කළ අය විනිශ්චය සඳහා උත්ථාන කරනු ලබති. ජොහන් 5 :28-29

# ජේසුස්වහන්සේ උත්ථාන වීමෙන් පසු පෙනී සිටීම

සතියේ පළමු වන දා අලුයම ජේසුස්වහන්සේ නැගිට වදාළ කල, උන්වහන්සේ තමන් විසින් දුෂ්ටාත්මයන් සත් දෙනෙකු දුරු කරනු ලැබූ මග්දලායේ මරියාට මුලින් ම දර්ශනය වූ සේක. ඉක්බිති ඔවුන්ගෙන් දෙදෙනෙකු පිටිසරට යන කල උන්වහන්සේ අන් විලසකින් ඔවුන්ට දර්ශනය වූ සේක. මාර්ක් 16 : 9,12

සතියේ පළමු වන දා වූ එදා සවස ජුදෙව්වරුන්ට බියෙන් ශ්‍රාවකයන් දොරවල් වසා ගෙන සිටි තැනට ජේසුස්වහන්සේ වැඩම කර ඔවුන් මැද සිට,"ඔබට ශාන්තිය වේවා!යි වදාළ සේක.උන්වහන්සේ මෙසේ වදාරා තමන් අත් ද ඇලය ද ඔවුන්ට පෙන්වූ සේක.ශ්‍රාවකයෝ සමිඳාණන්වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනා ගියහ. ජොහන් 20 :19-20

එහෙත් දෙවියන්වහන්සේ තුන් වන දා උන්වහන්සේ උත්ථාන කොට දර්ශනය වන්නට සැලැස්සූ සේක.උන්වහන්සේ සියල්ලනට ම පෙනුණේ නැත. දෙවියන්වහන්සේ විසින් කලින් තෝරා ගන්නා ලද සාක්ෂිකරුවන් වන, උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු උන්වහන්සේ සමග එකට කෑවා වූ , බීවා වූ අපට ම ය. ක්‍රියා 10 : 40-41

"ඔබට ශාන්තිය වේවා!"යි යළිත් උන්වහන් සේ ඔවුන්ට වදාරා"පියාණන්වහන්සේ මා එවා වදා ළාක් මෙන් මම ද ඔබ යවමි"යි ඔවුන්ට කී සේක. "ශුද්ධාත්මයාණන් පිළිගන්න:

ජොහන් 20: 21-22ඞී

"ස්වර්ගයේ ද පොළොවෙහි ද සියලු බලය මට පවරා තිබේ.එබැවින් ඔබ ගොස්, සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න;පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම ස්නාපනය කරන්න: මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න.මම ද යුගාන්තය දක්වා සදහට ම ඔබ හා සමග සිටිමි" යි වදාළ සේක.

මතෙව් 28: 18ඞී -20

එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල, ඔබ බලය ලබන්නහු ය.එවිට ඔබ ජෙරුසලමෙහි ද මුළු ජුදයෙහි ද හා සමාරියෙහි ද පොළොවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂි කාරයෝ වන්නහු ය" යි වදාළ සේක.උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලා සිටිය දී ම ඔසවාගනු ලැබ,වලාකුළකින් වැසී ඔවුන්ට නොපෙනී ගිය සේක. උන්වහන්සේ යන කළ, ඔවුන් අහස දෙස බලා ගෙන සිටිය දී සුදුවතින් සැරසුණු මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිට,

ක්‍රියා 1: 8-10

එවිට මම පියාණන්වහන්සේගෙන් අයැදින්නෙමි. උන්වහන්සේ ද ඔබ සමග සදහට ම සිටින පිණිස වෙනත් සහායදායකයෙකු දෙන සේක. ඒ සහාය දායකයාණෝ සත්‍යයේ ආත්මයාණෝය. උන්වහන් සේ පිළිගැනිමට ලෝකයා අපොහොසත් ය. මන්ද, ලෝකයා උන්වහන්සේ දකින්නේ වත් හඳුනන්නේ වත් නැත. එහෙත් ඔබ උන්වහන්සේ හඳුනන්නහු ය. මන්ද,උන්වහන්සේ ඔබ සමග නැවතී සිටිමින්, ඔබ තුළ වැඩ වසන සේක.ඔබ අනාථ වීමට ඉඩ නොදෙන්නෙමි.

ජොහන් 14: 16-18

තවද, පෙන්තකොස්ත දිනය පැමිණි කල,ඔව්හු සියල්ලෝ එක් තැනක රැස් ව සිටියාහ.එකල, සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණේය.ඔවුන් හිඳගෙන සිටි ගෙය මුළුමනින් ම එයින් පිරී ගියේ ය.ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු ඔවුන්ට පෙනිණි.ඔව්හු සියල්ලෝ ම ශුද්ධාත්මයන්ගෙන් පූර්ණ වී ආත්මයාණන් ඔවුන් ට දුන් කතා ශක්තිය ලෙස අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත්හ.

ක්‍රියා 2 :1-4

මා තුළ සිටින්න. මම ද ඔබ තුළ සිටිමි. මිදි වැලට යා වී නැත්නම් වෙන් ව පල දරන්නට ඊට නොහැකි සේ,ඔබ මාහා ඒකාබද්ධ නොවන්නහු නම්,පල දැරීමට ඔබට නොහැකි ය.මිදි වැල මම ය.ඔබ අතු ය.යමෙක් මා තුළ සිටින්නේ ද,මම ඔහු තුළ සිටිමි ද ඒ තැනැත්තේ බොහෝ පල දරයි. මන් ද,මාගෙන් වෙන් ව කිසිවක් කරන්නට ඔබට නොහැකි ය.

ජොහන්:15:4-5

උන්වහන්සේගේ ආඥා පිළිපදින්නා, උන් වහන්සේ තුළ වෙසෙයි;උන්වහන්සේ ද, ඔහු තුළ වැඩ වසන සේක.උන්වහන්සේ අප තුළ වැඩවසන බව අප දන්නේ උන්වහන්සේ අපට දුන් ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ය.

1 ජොහන් 3:24

මම ක්‍රිස්තුන්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි;ඉතින් දැන් ජීවත් වන්නේ මා නොවේ;ක්‍රිස්තුන්වහන්සේ මා තුළ ජීවත් වනසේක.තවද මා දැන් මාංසයෙහි ජිවත් වන ජිවිතය මට ප්‍රේම කළ මා උදෙසා සිය දිවි දුන්, දෙවියන්'වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්'ලෙන් ජිවත් වෙමි.

ගලාති 2:20

උන්වහන්සේගේ මහිමතාවේ සම්පතේ හැටියට ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ඔබේ ආධ්‍යාත්මික භාවය ශක්ති සම්පන්න වන පිණිස ඔබට බලය දෙන ලෙස ද,ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුන්වහන්සේ ඔබේ සිත් තුළ වාසය කරන පිණිස ද,යාච්ඤා කරමි. එපිස 3:16- 17එ

“මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය; මොහු කෙරෙහි මම ප්‍රසන්න ව සිටිමි” කියන හඬක් උත්කෘෂ්ට තේජසින් උන්වහන්සේ කරා පහළ වූ කල්හි දෙවි පියාණන්වහන්සේගෙ ගෞරවයත් මහිමයත් උන්වහන්සේ ලැබූ සේක. උන්වහන්සේ සමග ශුද්ධ කන්ද මත සිටිය දී මේ හඬ ස්වර්ගයෙන් නික්ම එනු අපි අපේ ම කන්වලින් ඇසීමු.

2 පේදුරු 1:17-18

ඒ පහන් රුක් මැද, පාද දක්වා වස්ත්‍රයක් හැඳ, ළය රන් පටියක් බැඳගෙන සිටි, මනුෂ්‍ය පුත්‍රයෙකු වැනි තැනැත්තෙකු ද දිටිමි. උන්වහන්සේගේ හිස ද හිසකෙස් ද ලෝම මෙන් ද හිම මෙන් ද සුදෝසුදු ය; ඇස් ගිනි දැල්ලක් හා සමාන ය; පාද උදුනක ගිනියම් කළ දිලිසෙන ලෝකඩ වැනි ය; උන්වහන්සේගේ කටහඬ සමුද්‍ර ඝෝෂයක් හා සමාන ය; දකුණතෙහි තාරකා සතක් විය; උන්වහන්සේගේ මුඛයෙන් දෙමුවහත් තියුණු කඩුවක් නික්මිණි. උන්වහන්සේ ගේ මුහුණ මද්දහනේ හිරු මෙන් දීප්තිමත් ව බැබළිණි.උන්වහන්සේ දුටු කල, මම මළ තැනැත්තෙකු මෙන් උන්වහන්සේ පාමුල වැටුණෙමි. උන් වහන්සේ සිය දකුණත මා පිට තබා මෙසේ වදාළ සේක:“ බිය නොවන්න. මම පළමු වැන්නා සහ අන්තිමයා ය.

එළිදරව් 1:13-17

මුලින් ඔබ මට දැක්වූ ප්‍රේමය දැන් නැත.පසුතැවී සිත හරවා ගන්න. මුලින් කල ක්‍රියා නැවත කරන්න: එළිදරව් 2: 4බී -5බී

ඔබ විඳින්නට යන දේවලට බිය නොවන්න.බලන්න,ඔබ විමසන පිණිස, යක්ෂයා ඔබෙන් සමහරෙකු සිරගත කිරීමට අර අඳිමින් සිටියි. දස දවසක් ඔබ පීඩා විඳින්නහු ය. මරණය දක්වා විශ්වාසී ව සිටින්න: එවිට මම ඔබට ජීවන කිරුළ ප්‍රදානය කරමි. එළිදරව් 2:10

ජයග්‍රහකයා මෙලෙස දවල වස්ත්‍රයෙන් සරසනුලබන්නේ ය. මම ඔහුගේ නාමය ජීවන පොතෙන් මකා නොහරින්නෙමි. කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක් මම ඔබ ඉදිරියෙහි තැබුවෙමි.ඔබට ඇති ශක්තිය ස්වල්ප වූ නමුත්,ඔබ මාගේ වචනය පිළිපැද්දහුය. මාගේ නාමය ප්‍රතික්ෂේප නොකළහු ය. එළිදරව් 3 : 8බී

ඔබ උණුසුම් ව හෝ ශීතල ව හෝ නොසිට, ඇල්මැරී සිටින බැවින් මම මාගේ මුඛයෙන් ඔබ වමාරන්නෙමි. එළිදරව් 3:16

මා ප්‍රේම කරන සියල්ලන්ට තරවටු කර මම ඔවුන් හික්මවමි. මා ජයගෙන, පියාණන්වහන්සේ සමඟ, උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත්තාක් මෙන්, ජයග්‍රාහකයාට ද මාගේ සිංහානයෙහි මා සමඟ හිඳ ගැන්මට දෙන්නෙමි.

එළිදරව් 3:19ඒ, 21

එහෙත් උන්වහන්සේ පව් උදෙසා සදහට ම එක ම පූජාවක් ඔප්පු කොට, දෙවියන්වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක. හෙබ්‍රෙව් 10:12

අහස් මඬල ඉක්මවා ගිය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයෙකු අපට සිටින නිසා, අපේ ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු.මන්ද,අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයෙකු, නොව, හැම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. එබැවින් අපේ අවශ්‍යතාවන්හි දී අපේ සරණ සදහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැති ව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු. හෙබ්‍රෙව් 4:14-16

එහෙත් ජේසුස්වහන්සේ සදහට ම පවතින හෙයින් උන්වහන්සේගේ පූජක ධුරය අන් කෙනෙකුට පැවරිය නොහැකි ය.උන්වහන්සේ මගින් දෙවියන්වහන්සේ වෙතට ළඟා වන්නන් සදහට ම ගළවන්නට උන්වහන්සේට පිළිවන.මන්ද ඔවුන් උදෙසා මැදහත් වීමට උන්වහන්සේ සදහට ම ජීවත් වන බැවිනි. හෙබ්‍රෙව් 7:24-25

ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදහටමත් ඒකාකාර මය. හෙබ්‍රෙව් 13:8

මා සිටින තැන ඔබත් සිටින පිණිස ඔබ කැදවාගෙන යාමට මම නැවත එන්නෙමි

ජොහන් 14:3බී

මන්ද සමිදාණන්වහන්සේ ම අණ දීමේ ශබ්දය ද අගු දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන්වහන් සේගේ හොරණෑ නාදය ද, ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක. ක්‍රිස්තුස්වහන්සේ අදහමින් උන්වහන්සේ තුළ සැතපුණු අය පළමුකොට නැගිටින්නෝ ය. එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමග සමිදාණන්වහන්සේ හමු වන පිණිස, වලාකුළුවලින් අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතරම සමිදාණන්වහන්සේ සමග සිටින්නෙමු.

1 තෙසලෝනික 4:16-17

මන්ද විදුලිය, පෙරදිගින් නික්ම අපරදිග දක්වා විහිදෙන්නේ යම්සේ ද, මනුෂ්‍ය පුත්‍රයාණන්ගෙ 'පුනරාගමනය එසේම වන්නේය. එකල මනුෂ්‍ය පුත්‍රයාණන් ගේ සළකුණ අහසෙහි පහළ වෙයි. එවිට පොළොවේ සියලු ගෝත්‍රයෝ වැලපෙන්නෝ ය. ඔව්හු මනුෂ්‍ය පුත්‍රයාණන් බලපරාක්‍රමයනේ ද මහා තේජශ්‍රීයෙන් ද අහසේ වලාකුළු මත වඩිනු දකින්නෝය. උන්වහන්සේ මහත් හොරණෑ හඬක් සහිත ව තම දූතයන් එවන සේක. ඔව්හු අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා සිව්දිගින් තෝරාගත්තවුන් රැස් කරන්නෝ ය.

මතෙව් 24:27,30-31

මන්ද,දැන් සියලු මනුෂ්‍යයන්ට සියලු තැන්හි පසු තැවී සිත් හරවා ගන්නට දැන් අණ කරන සේක. තමන්වහන්සේ විසින් පත් කරන ලද මනුෂ්‍යයෙකු ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කිරීමට එක් දවසක් නියම කර තිබේ. උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් උත්ථාන කිරීමෙන් සියල්ලන්ට ඒ ගැන සහතිකයක් දී තිබේ. ක්‍රියා 17:30බී ,31ඒ

එහෙයින් අප එකිනෙකා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දෙනු ඇත.

රෝම14 :12බී

එහෙත් සමිදාණන්වහන්සේගේ දවස සොරෙකු මෙන් හදිසියෙන් පැමිණෙයි. ඒ දවසේ දී අහස ගිගුරුම් හඬ දෙමින් පහ වී යන්නේ ය; මහා භූතයෝ ද ගිනිගෙන උණු වී යන්නෝ ය;පොළොව ද එහි ඇති සියල්ල ද දැවී විනාශ වී යන්නේ ය.මේ මුළු විශ්වයමේ අයුරින් විනාශ වී යන බැවින් ,ඔබ කොයි ආකාර අය විය යුතු ද? ඔබ ශුද්ධ හැසිරීමකින් භක්තිවන්ත ලෙස ජීවත් විය යුතු ය. දෙවියන්වහන්සේගේ දවස පැමිණීම බලා සිට,එය ඉක්මන් කිරීමට උත්සාහ කරන්න. ඒ දවසේ දී අහස ගිනිගෙන විනාශ වනු ඇත. මහා භූතයන් දැවී උණු වී යනු ඇත.එහෙත් ධර්මිෂ්ඨකමට වාස භූමිය වූ නව අහසක් ද නව පොළොවක් ද.

2 පේදුරු 3:10-13

දෙවියන්වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන්වහන්සේට දුන් සේක.එසේ කලේ, ස්වර්ගයෙහි ද පොළොවෙහිද ,පාතාල ලෝකයෙහි ද සියල්ලන් ජේසුස් යන නාමයට දණ නමන පිණිසත් ජේසුස්ක්‍රිස්තුස්වහන්සේ සමිඳාණන්වහන්සේ යයි දෙවි පියාණන්වහන් සේගේ මහිමය සඳහා සෑම දිවකින්ම ප්‍රකාශ කරන පිණිසත් ය. පිලිප්පි 2: 9-11

තව දුරටත් බලා සිටිය දී මම රාත්‍රි දර්ශනව ල දී මෙසේ දිටිමි. මනුෂ්‍ය-පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරානිකයාණන් වෙත එළඹුණේය. උන්වහන්සේ පෞරානික යන් වෙත පමුණුවනු ලැබුසේක. සියලු ජනයන් ද ජාතීන් ද භාෂාවන් ද උන්වහන්සේට සේවය කරන පිණිස පාලන බලය ද ගෞරවය ද රාජ්‍යයද

උන්වහන්සේට දෙන ලද්දේ ය. උන්වහන්සේ ගේ පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන්වහන්සේගේ රාජ්‍යය කිසිකලෙක නැති නොවන්නේ ය.

දානියෙල් 7:13-14

ලෝකයේ රාජත්වය සමිඳාණන්වහන්සේ ට ද උන්වහන්සේගේ ආලේප ලත් ක්‍රිස්තුස්වහන්සේටද අත්විය. උන්වහන්සේ සදහටම රජකම් කරන සේකැයි කියන මහා ශබ්ද ස්වර්ගයෙහි විය. එළිදරව්: 11:15එ

වෙහෙස වන,බර උසුලනි සියල්ලෙනි, මා වෙතඑන්න; මම ඔබට සහනය දෙමි. මා ගුණවත්, මෘදු, නිහතමානි කෙනෙකු බැවින් මාගේ වියගහ කරටගෙන මාගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනයලැබෙනු ඇත.

මතෙව් 11:28-29

මෙන්න,මම දොර ළග සිට තට්ටු කරමි.යමෙක් මාගේ හඩ අසා දොර අරින්නේ නම් මම ඇතුළු වී,ඔහු සමග කෑම කන්නෙමි.ඔහු ද මා සමග කෑම කන්නේය.

එළිදරව් 3:20

පමා වීඇතැ යි සමහරුන් සිතන නමුත්, සමිදාණන්වහන්සේ සිය පොරොන්දු ඉටු කිරීමට පමා වී නැත.එහෙත්ලකිසිවෙකු විනාශ වීම උන්වහන්සේගේ කැමැත්ත නොවන බැවින් සියල්ලනට පසුතැවී සිත් හරවා ගැනීම සඳහා අවස්ථාවක් ලැබෙනු පිණිස උන්වහන්සේ ඔබ ගැන බොහෝ කල් ඉවසන සේක.

2 පේදුරු 3:9

පියාණන්වහන්සේ මට දෙන සියල්ලෝ ම මා වෙතට පැමිණෙති;මා වෙතට පැමිණෙන්නා මම කිසි සේත් ඉවත නොදමමි.

ජොහන් 6 :37

සමිදාණන්වහන්සේගේ නාමය කියා අයැදින කවුරු නමුත් ගළවනු ලබන්නෝ ය.

ක්‍රියා 2:21

යමෙක් පුත්‍රයාණන් අදහන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත.එහෙත් යමෙක් පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහුට ජීවනය නොලැබේ. දේව උදහස ඔහු පිට රදා පවතියි.

ජොහන් 3 :36

මේ සා උදාර ගැළවීමක් අප නොසලකා සිටියොත්,අපි කෙසේ ගැළවෙමු ද?

හෙබ්‍රෙව්2: 3 බී

එසේ වුවද උන්වහන්සේ පිළිගත් සියල්ලන්ට එනම් උන්වහන්සේගෙ නාමය අදහාගත් අයට දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්වහන්සේ දෙවා වදාළ සේක.

ජොහන්1 :12

එසේ නම් කිමෙක් ද? ඔබ එලියා දැ යි ඔව්හු ඇසූ හ.නැතැ යි ඔහු කී ය. ඔබ ඒ දිව්‍යවැසිවරයා ද ? යන ප්‍රශ්නයටත් නැතැ යි ඔහු කීය.

ජොහන් 1 :21

මඟ පෙන්වීමේ යාච්ඤාව

ආදරණීය ජේසුස් ස්වාමිනි මාගේ පාපය ඉවත් කිරීම පිණිස කුරුසියේ ජිවිතය පුද කලාට ස්තුතියි.මගේ ජිවිතයෙන් මා කලාවු වැරදි වලට පසුතැවිලි වී, මගේ ස්වාමින් හා ගැළවුම්කාරයා ණන් හැටියට මගේ හදවත තුලට පිළිගනිමි. ඔබවහන්සේ මා හට දෙන්නාවු දේව දරුකම පිළිගනිමි.ඔබවහන්සේ උදෙසා ජීවත් වීමට එදිනෙදා ඔබගේ ශක්තිය ඉල්ලා සිටිමි. ආමෙන

